"රැක්මට මුල්තැන"

රක්නා ආරක්ෂක ලංකා ලිමිටඩ්

(ආරක්ෂක අමාත්‍යාංශයට අනුබද්ධිත)

வரையறுக்கப்பட்ட ரக்னா அரக்ஷக லங்கா

Rakna Arakshaka Lanka Ltd

(Affiliated to the Ministry of Defence)

අංක. 143/ඒ, කිරුළපන ඇවනිව්, කොළඹ 05. | இல. 143/A, கிருலபன அவென்யு, கொழும்பு 05. | No.143/A, Kirulapone Avenue, Colombo 05.

Reg. No PB 456

මිළ කැඳවීමේ අංකය: **RALL/ PROCUREMENT/2026/176 ( )**

.....

.....

.....

2026 නොවැම්බර් මස 13 දින.

මිල කැඳවීමේ නිවේදනය සහ ටෙන්ඩර් කොන්දේසි

සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම යනු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආරක්ෂක සමාගමක් වන අතර, ආරක්ෂක නිළධාරීන්ගෙන් බහුතරයක් ත්‍රිවිධ හමුදාවෙන් විශ්‍රාමලත් හා නීත්‍යානුකූලව සේවයෙන් ඉවත් වූ හමුදා සාමාජිකයින් වේ. ආරක්ෂක කටයුතුවලට අමතරව සනීපාරක්ෂක සේවා හා ආහාර සැපයීමේ ව්‍යාපාරයත් මෙම සමාගම වෙතින් පවත්වාගෙන යනු ලබන අතර, ආරක්ෂක අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනයක් වේ.

1. සභාපති සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම වෙනුවෙන් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව වෙතින් මෙයට ඇමුණුම "අ" යටතේ දක්වා ඇති උපලේඛණය අනුව **මෙයට ඇමුණුම "අ" යටතේ දක්වා ඇති උපලේඛණය අනුව සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගමේ අවශ්‍යතාවය සඳහා Sleeping Bags, මිලදී ගැනීම හා සැපයීම සිදු කිරීම** සඳහා මිළගණන් කැඳවනු ලැබේ.

2. **මිළ ගණන් වසනු ලබන වේලාව සහ දිනය** - මෙම මිළ ගණන් **2026/11/26 දින 1350** පැයට වසනු ලැබේ. එම දින එම වේලාවෙන් පසුව මිළ ගණන්පත් භාර ගනු නොලැබේ. මෙම දින නියමිත වේලාවට පසුව ඉදිරිපත් කරනු ලබන මිළ ගණන්පත් ප්‍රතික්ෂේප කරන අතර, මිළ ගණන් විවෘත කිරීම **2026.11.26 දින 1400** පැයට සිදු කරනු ලැබේ.

3. **මිළ ගණන්පත් වලංගු කාලය** - සියලුම මිළ ගණන්පත් අවම වශයෙන් **ඒවා විවෘතකරන දින සිට දින ....90... ක් ඉදිරියට වලංගු විය යුතුයි.**

4. **මිළ ගණන් ඉදිරිපත්කිරීම** - ලංසු තබන්නන් විසින් මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී මෙම මිළ කැඳවීම් නිවේදනයේ සඳහන් ටෙන්ඩර් කොන්දේසි වලට එකඟවන බවට මෙම **මිළ ගණන්පතේ අවසාන පිටුවේ (ඇමුණුම්වලට පෙර) අත්සන්කර**, අත්සන් කරනු ලැබූ අයගේ නම, ආයතනයේ නම, ආයතනයේ මුද්‍රාව තබා සහතික කර ඉදිරිපත් කල යුතුය. **ආයතනයේ අවසරලත් නිලධාරීයෙකු විසින් නිසි පරිදි අත්සන් කිරීමකින් තොරව ඉදිරිපත් කරනු ලබන මිළ ගණන්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.** මිළගණන්පත් ලිපි කවරයක බහා මුද්‍රාතබා ආරක්ෂිතව (ආයතනයේ ලිපි ශීර්ෂයක ආවරණ ලිපියක් සහිතව හෝ නොමැතිව) මිළ ගණන්පත් වසනු ලබන දිනයේ එම වේලාවට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ **මෙම ආයතනයේ L මහලේ (Lobby) හි තබා ඇති ටෙන්ඩර් පෙට්ටිය වෙත රැගෙනවිත් බහාලිය යුතුය. මිළ ගණන් කැඳවීමේ අංකය, මිළගණන් විවෘත වන දිනය සහ වේලාව ලියුම් කවරයේ වම් උඩ කෙලවරේ සටහන් කර යටින් ඉරක් ඇඳිය යුතුය.**

මිල කැඳවීමේ අංකය **RALL/PROCUREMENT/2026/176** ..... ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සභාපති
මිලගණන් විවෘතකරන දිනය හා වේලාව **2026.11.26 1400** පැයට සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම
නො.143/ඒ, කිරුළපන ඇවනිව්, කොළඹ 05.

5. මිළ ගණන් පත් මෙම ආකෘති පත්‍රයේ අමුණා ඇති උපලේඛණය අනුව ඉදිරිපත්කල යුතුය. කෙසේ වෙතත් එම ආකෘතියට අනුව සකස් කරන ලද ලංසු තබන්නාගේ ආයතන ලිපි ශීර්ෂයක් යටතේ සකසන ලද ලංසු ලේඛණයක් වේනම් එයද ඉදිරිපත් කල හැකි අතර මිළ කැඳවීමට අදාල භාණ්ඩයේ සියලුම කාර්මික තොරතුරු (Technical Literature) පාරිභොගික අත්පොත හෝ රූපසටහන් (Pamphlets and Drawing) වේ නම් අදාලවන පරිදි මිළ ගණන්පත සමඟ අමුණා එවිය යුතුය.

6. **නියැදියන් (Sample) ඉදිරිපත් කිරීම.** - ලංසු ඉදිරිපත් කිරීමට අදාලව නියැදියන් සැපයිය යුතු අතර එම නියැදියන් මත ආයතනයේ නම සහ පිරිනැමුම් අංකය නොමැකෙන ලෙස සටහන්කර **මිළගණන් විවෘත කිරීමට**

PPS PREMARATHNA MA, BA
Lieutenant Commander (Retd)
Manager - Procurement
Rakna Arakshaka Lanka Ltd.

නියමිත දින එම වේලාවට ප්‍රථම ටෙන්ඩර් පෙට්ටිය තබා ඇති ස්ථානයේ සිටින නිළධාරියා වෙත භාරදිය යුතුය. යම් කිසි අවස්ථාවක නියඳියන් ඉදිරිපත් කරන ලෙස ලිඛිතව දැනුම් දුන් පසු නියමිත දින නියමිත වේලාවට පසුව ඉදිරිපත් කරනු ලබන නියැදියන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(අ) සාම්පල වශයෙන් .....01..... බැගින් ඉදිරිපත් කරන්න.

7. මිළගණන් විවෘත කිරීම. ඉදිරිපත්කර ඇති සියලුම මිළගණන් පත් මිළගණන් වසනු ලබන දිනය හා නියමිත වේලාව අවසානයේදී එම ස්ථානයේදීම විවෘත කරනු ලබන අතර එම දිනයේදී මිළ ගණන් විවෘත කරන ස්ථානය වෙත ලංසු තබන්නාට හෝ ලංසු තබන්නාගේ බලය ලත් නියෝජිතයෙකු හට පැමිණීමට අවකාශ ඇත.

8. මිළගණන්. - දේශීය වශයෙන් භාරදෙනු ලබන භාණ්ඩ/සේවා සඳහා (දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ/සේවා සහ සැපයුම්කරුවන් විසින් විදේශ රටකින් ආනයනයකර සැපයුම්කරනු ලබන භාණ්ඩ/සේවා ද ඇතුළුව) මිළගණන් ඉදිරිපත්කිරීමේදී ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්විය යුතුය.

9. මිළගණන් කැඳවීම.- මිළගණන් කැඳවීම ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි සැපයුම්කරුවන් , ශ්‍රී ලංකා ටෙලිකොම් රේන්බෝ පිටු වල ලියාපදිංචි සැපයුම්කරුවන් සහ ප්‍රාදේශීය සැපයුම් කරුවන් වෙතින් සිදුකරන අතර සැපයුම්කරුවන් වෙතින් උපරිම තරගකාරීත්වය ඇතිවන පරිදි මිළගණන් කැඳවීමේ අයිතිය සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගමේ ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටු සභාපති සතුවේ.

10. භාණ්ඩ/සේවා සැපයීම.- සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම විසින් තෝරා ගත් සැපයුම් කරුවන් සඳහා ප්‍රසම්පාදනයට අදාලව නිකුත් කරන ඇණවුම්පත මගින් (Purchasing Order) [illegible] අවසන් කලයුතුය.

11. දේශීය වශයෙන් භාරදෙනු ලබන භාණ්ඩ සඳහා මුදල් ගෙවීම් - සැපයුම් කරනු ලබන භාණ්ඩ භාරගැනීමට ප්‍රථම මුලිකව පරීක්ෂා කිරීමෙන් පසු තොගයට ගැනීමට කටයුතු කරන අතර ඒ අනුව ගෙවීම් කටයුතු සිදුකරනු ඇත. සී/ස රක්නා ආරක්ෂක ලංකා ගබඩාවන් වෙත භාණ්ඩ භාරදීම සිදුකල අවස්ථාව සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම වෙත භාණ්ඩ භාරගැනීමක් ලෙස නොසැලකිය යුතු අතර එසේ භාරදෙන ලද භාණ්ඩ, පිරිවිතර හි ප්‍රමිතිය පිලිබඳව පරීක්ෂාකර තහවුරු කරගැනීමෙන් පසුව පමණක් මෙම සමාගමේ තොගය වෙත භාණ්ඩ භාරගත් ලෙස සලකනු ලැබේ. කිසියම් භාණ්ඩයක් නිවැරදි පිරිවිතරයන්ට අනුව හෝ නියමිත ප්‍රමිතයට හෝ අනුමත නියැදියට අනුව සපයා නොමැති අවස්ථාවලදී එම භාණ්ඩ භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලබන අතර එවැනි අවස්ථාවකදී ඒ බැව් දැනුම් දී (වාචිකව හෝ ලිඛිතව) දින 07 ක් තුලදී සැපයුම්කරු විසින් එම භාණ්ඩ නැවත භාරගෙන නිවැරදි පිරිවිතර, ප්‍රමිතිය හා අනුමත සාම්පල අනුව නිවැරදිකර අලුත් භාණ්ඩ මාසයක් ඇතුලත නැවත සැපයුම්කල යුතුය. ඒ සඳහා වන වියදම් සැපයුම්කරු විසින් දැරිය යුතුය. අවශ්‍ය වේනම් ඕනෑම අවස්ථාවදී ඕනෑම භාණ්ඩයක් පිලිබඳව ඒවයේ ගුණාත්මක භාවය හා පිරිවිතරයන්ට අනුව සපයා ඇත්ද යන්න ස්වාධීන ආයතනයක් වෙතින් පරීක්ෂාකර තහවුරු කර ගැනීමේ අයිතිය මෙම සමාගම සතුවේ. භාණ්ඩ මෙම සමාගම වෙත සැපයීම පිලිගැනීමෙන් පසු දින 30 අතර ණය පහසුකම් කාලයක් මුදල් නිරවුල් කිරීම සඳහා සැපයුම්කරු විසින් සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම වෙත ලබා දිය යුතු අතර, ඒ අනුව ප්‍රධානි - මුල්‍ය විසින් සැපයුම්කරුවන් වෙත මුදල් ගෙවීම් කටයුතු සිදුකරනු ඇත.

PPS PREMARATHNA MA, BA
Lieutenant Commander (Retd)
Manager - Procurement
Rakna Arakshaka Lanka Ltd.

12. <u>ප්‍රසම්පාදන කමිටු අයිතිය.</u>- ඉදිරිපත් කරනු ලබන මිළගණන් පත් සම්පූර්ණ හෝ කොටස් වශයෙන් පිලිගැනීමක් සිදුකිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුව/සභාපති සතුවන අතර එම තීරණය අවසාන තීරණය වේ. සාර්ථක සැපයුම්කරුවන් වෙත නිළ වශයෙන් දැනුම්දීමක් සිදුකරනු අතර තෝරා නොගත් සැපයුම්කරුවන් සම්බන්ධව කිසිදු දැනුම්දීමක් සිදුකරනු නොලැබේ. ස්තුතියි.

මෙයට විශ්වාසී

.....

සභාපති වෙනුවට

PPS PREMARATHNA MA, BA
Lieutenant Commander (Retd)
Manager - Procurement
Rakna Arakshaka Lanka Ltd.

මම/අප විසින් ඉහත සඳහන් ටෙන්ඩර් කොන්දේසි සඳහා එකඟවන අතර මා/අප වෙත ටෙන්ඩර් ප්‍රදානය කරනු ලැබුවහොත් ඉතා උසස් තත්වයේ **Sleeping Bags** නිවැරදිව පිරිවිතරයන්ට හා ප්‍රමිතින්ට අනුව මාගේ මිළ ගණන්පත්‍රයේ දක්වා ඇති සැපයීම් කාලසීමාව තුලදී සැපයීමට මා/මාගේ සමාගම ක්‍රියා කරනු ලබන බවට එකඟවනු ලැබේ.

.....

අත්සන.

.....

ඉහත අත්සන් කර ඇති අයගේ සම්පූර්ණ නම.

.....

ආයතනයේ නම.

දිනය: .....

ආයතනයේ නිළ මුද්‍රාව

මිළගණන් කැඳවීමේ අංකය : **RALL/PROCUREMENT/2026/176**

ඇමුණුම "අ"

මිළගණන් උපලේඛණය

අවශ්‍යතා නාමාවලිය	ප්‍රමාණය (ගණනින්)	වර්ගය	එකක මිළ රු.	මුළු මුදල රු.
සි/ස රක්නා ආරක්ෂක ලංකා සමාගමේ අවශ්‍යයතාවය සඳහා **Sleeping Bag** මිලදී ගැනීම හා සැපයීම සිදු කිරීම.				
නිදන මළු (සියෙස්ටා) ***Sleeping Bags/Journey Mattress*** (ඉරිජිනල් ඇඳුම්ණා ආන)	**50**			
(මිළ ගණන් ඉදිරිපත් කරන අයිතම සඳහා සාම්පලයක් රක්නා ආරක්ෂක ලංකා මූලස්ථානය වෙත ලබා දීමට කටයුතු කරන්න)				
එකතුව				
වට්ටම් මුදල				
එකතුව (වට්ටම් මුදල ලබාදීමෙන් පසු)				
වැට් බද්ධ 18 %				
සම්පූර්ණ එකතුව				

01. (අ) නිෂ්පාදිත රට: .....

(ආ) වගකීම් කාලය : (වගකීම් කාලය ලබා දෙනු ලබන පිළිවෙත විස්තරව දක්වන්න)

: .....

(ඇ) නිෂ්පාදකයාගේ නම සහ ලිපිනය: .....

.....

ඈ) මිල ගණන් වලංගු කාලය : .....

ඉ) සැපයීමෙන් පසු ගෙවීම් සිදුකල යුතු කාලසීමාව : .....

ඊ) සැපයීමට ගතවන කාලය : .....

02. එකතුකල අගය මත බදු ලියාපදිංචි අංකය: .....

03. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ අංකය : .....

(අ) ආයතනයේ නම සහ ලිපිනය: .....


(ආ) දුරකථන අංකය : ..... (ඇ) විද්‍යුත් ලිපිනය :.....


04. ලංසුව ඉදිරිපත් කරන්නාගේ අත්සන: ..... ආයතනික නිළ මුද්‍රාව: .....

05. දිනය: .....

PPS PREMARATHNA MA, BA
Lieutenant Commander (Retd)
Manager - Procurement
Rakna Arakshaka Lanka Ltd.

Journey Mattress





(72" x36" x1")

27/10/2020

Capt (Rtd) PUL Perera
Senior Manager - Logistics
Rakna Arakshaka Lanka Ltd